"නිරෝගිකම පරම සැපතයි"

අධ්‍යක්ෂ
பணிப்பாளர்
Director
081 – 2224336

කාර්යාලය
அலுவலகம்
Office
081 – 2222341/ 081-2220206-8

ෆැක්ස්
பகஸ்
Fax
081 – 2204755

මගේ අංකය
.எமது இல
My N0. CPC/PDHS/A-06/4/2024

ඔබේ අංකය
உமது இல
Your No. .....

දිනය
திகதி
Date 2024-02-12

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත
காதாரதினைக்களம்- மத்தியமாகானம்
Department of Health Services – Central Province.

163, සංඝරාජ මාවත, මහනුවර.
163, சங்கராஜமாவத்தை, கன்டி.
163, Sangaraja Mawatha, Kandy

ඉතා හදිසි
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
මහනුවර/මාතලේ/නුවරඑළිය

2024 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම
උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2023-12-19 දිනැති ලිපියට වැඩිමනක් වශයෙනි.

02.ඒ අනුව, 2024 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහා හෙද නිලධාරි තනතුරට අදාලව යොමු කර ඇති තථ්‍ය පුරප්පාඩු ලේඛනය 2024-02-12 දින නැවත මෙම දෙපාර්තමේන්තුවේ www.healthdept.cp.gov.lk වෙබ් අඩවියට යොමු කරන අතර, ඒ අනුව,2024 වර්ෂයේ ස්ථාන මාරු කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස දන්වමි.

03. ස්ථාන මාරු අයදුම්පත් යොමු කිරීමේදී තමන් දැනට සේවය කරන සේවා ස්ථානය ස්ථාන මාරු විමට අපේක්ෂිත සේවා ස්ථානය ලෙස සඳහන් නොකරන ලෙසත්, එය සැළකිල්ලට නොගෙන තම සේවා ස්ථානය සඳහන් කර ඇති අවස්ථා වලදි සේවා අවශ්‍යතාවය හා පුරප්පාඩු සැළකිල්ලට ගෙන ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි ස්ථාන මාරු කරනු ලැබේ. එමෙන්ම අසත්‍ය තොරතුරු ලබා දි ඇති අයවලුන් සඳහා ද ,ප්‍රමාණවත් පරිදි සේවා ස්ථාන නම් කර නොමැති විටද, අයදුම්පත් යොමු නොකරන ලද අවුරුදු 05 ට වැඩි සියලු නිලධාරින්ද ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි පුරප්පාඩු පවතින ස්ථාන වලට ස්ථාන මාරු කිරීමට කටයුතු කරනු ලැබේ.

04. තවද මේ සම්බන්ධව නොපමාව ඔබ කොට්ඨාශයේ අදාළ සියලුම කාර්යය මණ්ඩල දැනුවත් කරන ලෙසත්, 2024 වර්ෂයේ ස්ථාන මාරුවීම් අයදුම්පත් කැඳවා 2024 -02-16 දිනට ප්‍රථම අනිවාර්යෙන්ම මා වෙත යොමු කිරීමට ඔබගේ පෞද්ගලික අවධානය යොමු කර කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වමි.

වෛද්‍ය එම්.ඩී.උදාර ගුණතිලක.
නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට

o/c වෛද්‍ය එම්. ඩී. උදාර ගුණතිලක
නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
මධ්‍යම පළාත.

පිටපත්
01. ආයතනභාර වෛද්‍ය නිලධාරි, පුනරුත්ථාපන රෝහල ,දිගන
02.නියෝජ්‍ය අධ්‍යක්ෂ(පුහුණු) ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය යටිනුවර
03.වෛද්‍ය අධිකාරි, දිස්ත්‍රික් මූලික රෝහල තෙල්දෙණිය/දඹුල්ල/රිකිල්ලගස්කඩ/දික්ඔය

ස්ථාන මාරු අයදුම්පත් නැවත යොමු කිරීමට අවශ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සඳහා සහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත නොපමාව යොමු කිරීම සඳහා